# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 567 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 02/04/2024 පැය 0600

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - කලවාන පොලිස් වසම.

2024.04.01 වන දින සවස් කාලයේ කලවාන පොලිස් වසමේ කලවාන මතුගම මාර්ගයේ නගරය ආසන්නයේ දී තියුණු ආයුධයකින් ගෙල කපා පුද්ගලයෙකු වැටී සිටියදී කලවාන පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් කලවාන රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ දෙල්ගොඩ, කලවාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික අමනාපයක් හේතුවෙන් මෙම ඝාතනය සිදුකර ඇති අතර, ඝාතනය සිදුකල වයස අවුරුදු 37 ක් වන මානාන, කලවාන ප්‍රදේශයේ පදිංචි සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය කලවාන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කලවාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - මුතුර් පොලිස් වසම.

2024.04.01 වන දින දහවල් කාලයේ මුතුර් පොලිස් වසමේ බහිරියා නගර් කලපු ප්‍රදේශයේ පුද්ගලයෙකු සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට මුතුර් පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ බහිරියා නගර්, මුතුර් 01 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ දෑත් සහ දෙපා ගැට ගසා දෙඅත් වල වැලි උරයක්ද ගැට ගසා තිබී ඇති අතර, මෙය මනුෂ්‍ය ඝාතනයක් බවට සැකකරනු ලබයි. මරණකරු 2024.03.30 වන දින රාත්‍රී කාලයේ කිසිවෙකුටත් නොදන්වා නිවසින් පිටව

ගොස් ඇති බවත්, මානසික රෝගයකින් පෙළෙන පුද්ගලයෙකු බවටත් අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධ මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කර ඇත. ඝාතනය සිදුකල සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා මුතූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2024.04.01 වන දින රාත්‍රී කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ දෙමටගොඩ ගුවන් පාලම අසලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 420 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන දෙමටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හෝමාගම පොලිස් ස්ථානය.**

2024.04.01 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේ මාකුඹුර ගුවන් පාලම අසලදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.**

2024.04.01 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 150 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් සහ සැකකාරිය වයස අවුරුදු 46 වන මොරටුව හා දෙහිවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.**

2024.04.01 වන දින උදෑසන කාලයේදී කටුනායක පොලිස් වසමේ ආඩිඅම්බලම ප්‍රදේශයේ දී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින්

වැටලීමක් සිදුකර මත්පෙති ජාවාරමේ නිරතව සිටි පුද්ගලයෙකු **මත්පෙති 07 ක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන ආඬිඅම්බලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීම් වලදී සීදුව පොලිස් වසමේ විජයකුමාරතුංග රෝහල ඉදිරිපිට මත්පෙති තොග වශයෙන් ලබා දෙනු ලබන ඖෂධ හලක් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වී ඇති අතර, ඒ අනුව කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් එම ඖෂධ හල වටලා **මත්පෙති 550 ක්** සමඟ ඖෂධ හල පවත්වා ගෙන යන ලද පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 42 ක් වන සීදුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. කේරළ ගංජා සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පුනරින් පොලිස් ස්ථානය.**

2024.04.01 වන දින රාත්‍රී කාලයේ පුනරින් පොලිස් වසමේ ගෞතාරිමුනි ප්‍රදේශයේ දී පුනරින් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ 03 ග්‍රෑම් 900 ක්** සමග සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන පුනරින් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුනරින් පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. ගංජා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - සෙවනගල පොලිස් ස්ථානය.**

2024.04.01 වන දින උදෑසන කාලයේදී සෙවනගල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මොරකැටිය ප්‍රදේශයේ සිදු කල බස් රථ පරීක්ෂා කිරීමේ විශේෂ මෙහෙයුමක දී තණමල්විල දෙස සිට ඇඹිලිපිටිය දෙසට ධාවනය වූ මගී ප්‍රවාහන පුද්ගලික බස් රථයක් පරීක්ෂා කර ඇත. එහිදී එම බස් රථයේ ගමන් කල පුද්ගලයින් දෙදෙනෙකු සන්තකයේ තිබී **වියළි ගංජා කිලෝ ග්‍රෑම් 02 ක්** සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32 හා 39 වයස් වල පසුවන ආඬිගම හා කොට්ටුකච්චිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සෙවනගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. ගජමුතු සමග සැකකරුවෙකු අත්අඩංගුවට - බේරුවල පොලිස් ස්ථානය.**

2024.04.01 වන දින බේරුවල පොලිස් වසමේ මරදාන ප්‍රදේශයේ දී විකිණීම සඳහා පුද්ගලයෙකු ගජමුතු ළඟ තබාගෙන සිටින බවට බේරුවල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගජමුතු 04 ක්** සමඟ සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන දර්ගානගරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බේරුවල පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත් අඩංගුවට - තිරුක්කෝවිල් පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.04.01 වන දින උදෑසන කාලයේ තිරුක්කෝවිල් පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් විසින් තිරුක්කෝවිල් පොලිස් වසමේ සේනකාඩු ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමග සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන තිරුක්කෝවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන තිරුක්කෝවිල් 02 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තිරුක්කෝවිල් පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවන් දෙදෙනෙකු අත් අඩංගුවට - නෝර්වුඩ් පොලිස් ස්ථානය.**

2024.04.01 වන දින රාත්‍රී කාලයේ නෝර්වුඩ් පොලිස් වසමේ මහනොළු වතු යායේදී නෝර්වුඩ් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු කැණීම් උපකරණ සමග අත්අඩංගුවට** ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 47 හා 57 වයස්වල පසුවන මහනෙළුව වත්ත හා උඩුපුස්සැල්ලැව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

නෝර්වුඩ් පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - ආනමඩුව පොලිස් වසම.**

2024.04.01 වන දින සවස් කාලයේ ආනමඩුව පොලිස් වසමේ ඌරියාව වැවේ දිය නෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට ආනමඩුව පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ ඉහල කොළණිය, ඌරියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණ කටයුත සඳහා පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, ආනමඩුව පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - යාපනය පොලිස් වසම.

2024.04.01 වන දින උදෑසන කාලයේ යාපනය පොලිස් වසමේ කොළොම්බුතුරෙයි ප්‍රදේශයේ මුහුදු වෙරළේ ධීවර කටයුතු සඳහා ගිය පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට යාපනය පොලීසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත. පසුව නාවික හමුදා කිමිදුන් කරුවන් විසින් මෙම අතුරුදහන්වූ අයගේ මෘත ශරීරය මහේන්ද්‍රපුරම් මුහුදු තීරයේ තිබී සොයා ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වන පෙරිය කල්ලාරු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2024.03.31 වන දින උදෑසන නිවසෙන් පිටව ගොස් ඉහත ප්‍රදේශයේ මුහුදේ ජලයේ බැස මාළු අල්ලමින් සිටියදී මෙම අනතුරට ලක්ව ඇති බවට විමර්ශණයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, යාපනය පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 14. වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියයාම - සිරිපුර පොලිස් වසම.

2024.04.01 වන දින සවස් කාලයේදී සිරිපුර පොලිස් වසමේ කළුකැලේ ප්‍රදේශයේදී වන අලියෙකු පහරදීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට සිරිපුර පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 79 ක් වන කළුකැලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොලොන්නරුව රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. සිරිපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 15. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියයාම - පේරාදෙණිය පොලිස් වසම.

2024.04.01 වන දින සවස් කාලයේදී පේරාදෙණිය පොලිස් වසමේ පැණිදෙණිය කළුපාලම අසල දුම්රිය මාර්ගයේදී මහනුවර සිට නාවලපිටිය බලා ධාවනය වූ දුම්රියක පුද්ගලයෙකු ගැටී මියගොස් ඇති බවට පේරාදෙණිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වන තල්පිටිය උතුර, වාද්දුව ප්‍රදේශයේ පදිංචි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ අවසන් වසරේ ඉගණුම ලැබූ සිසුවෙකි.**

මෘත ශරීරය පේරාදෙණිය රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. පේරාදෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 16. මාරක රිය අනතුරක් - පල්ලම පොලිස් වසම.

2024.04.01 වන දින සවස් කාලයේ පල්ලම පොලිස් වසමේ ආණමඩුව බංගදෙණිය මාර්ගයේ පොත්තුක්කුලම 52 ගම්මානයට හැරෙන හන්දියේදී ආණමඩුව දෙස සිට බංගදෙණිය දෙසට ධාවනය වූ යතුරුපැදියක මාර්ගයේ ගමන් කල පදික කාන්තාවක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව හලාවත රෝහලට ඇතුලත් කිරීමේදි මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 89 ක් වන පහලයාය, පල්ලම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුරට සම්බන්ධ යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර, පල්ලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 17. මාරක රිය අනතුරක් - වේයන්ගොඩ පොලිස් වසම.

2024.04.01 වන දින සවස් කාලයේ වේයන්ගොඩ පොලිස් වසමේ වේයන්ගොඩ මල්ලැහැව මාර්ගයේ තල්ගස්මොටේ ප්‍රදේශයේදී වේයන්ගොඩ දෙස සිට මල්ලැහැව දෙසට ධාවනය වූ ත්‍රී රෝද රථයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පෙරලීගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ මගී කාන්තාවක් හා දැරියක් වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමේදී මගී කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 75 ක් වන පත්තලගෙදර, වේයන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ත්‍රී රෝද රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර, වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 18. මාරක රිය අනතුරක් - පාදුක්ක පොලිස් වසම.

2024.04.01 වන දින රාත්‍රී කාලයේ පාදුක්ක පොලිස් වසමේ පාදුක්ක ගොඩගම මාර්ගයේ පාදුක්ක ප්‍රදේශයේදී පාදුක්ක දෙස සිට ගොඩගම දෙසට ධාවනය වූ යතුරුපැදියක මාර්ගයේ ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා හා යතුරුපැදිකරු පාදුක්ක රෝහලට ඇතුලත් කිරීමේදී පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වන පාදුක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පාදුක්ක රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුර සම්බන්ධ පාදුක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 19. මාරක රිය අනතුරක් - පුදුකුඩිඉරිප්පු පොලිස් වසම.

2024.04.01 වන දින සවස් කාලයේ පුදුකුඩිඉරිප්පු පොලිස් වසමේ මුලතිව් පරන්තන් මාර්ගයේ කුරුවිල් හංදියේ සිට කුරුවිල් දෙසට ඇති අතුරු මාර්ගයේ කුරුවිල් දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක රියදුරු හට ඇති වූ හදිසි අසනීප තත්ත්වයක් හේතුවෙන් ට්‍රැක්ටර් රථයෙන් ඇද වැටී එම ට්‍රැක්ටර් රථයට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ට්‍රැක්ටර් රථ රියදුරු පුදුකුඩිඉරිප්පු රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වන උඩෙයාර්කට්ටු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පුදුකුඩිඉරිප්පු රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් පුදුකුඩිඉරිප්පු පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 20. හදිසි ගින්නක් - දෙහිවල පොලිස් වසම.

2024.04.01 වන දින රාත්‍රී කාලයේ දෙහිවල පොලිස් වසමේ ගුවන් පාලම මතදී කාර් රථයක හදිසි ගින්නක් හට ගෙන ඇති බවට දෙහිවල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් හා දෙහිවල ගල්කිස්ස නගර සභා ගිනි නිවන ඒකකයේ නිලධාරීන්ගේ සහාය ඇතිව ගින්න මැඩ පවත්වා ඇත.

ගින්න හේතුවෙන් ජීවිත හානි සිදුව නොමැති අතර, කාර්මික දෝෂයක් හේතුවෙන් මෙම ගින්න හට ගෙන ඇති බවට පොලිසිය සැකකරනු ලබයි. දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**